# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2024 අංක 37 දරන
## කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 ජූලි මස 02 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---


2024 ජූලි මස 05 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිල : රු. 54.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2024 අංක 37 දරන
# කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත

[සහතිකය සටහන් කළේ 2024 ජූලි මස 02 වන දින]

එල්.ඩී-ඕ. 49/2023

**කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; කාන්තාවන්ගේ අභිවෘද්ධිය සහ සවිබල ගැන්වීම පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිණිස ද; කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද; කාන්තා අයිතිවාසිකම් සඳහා වන පාර්ලිමේන්තු කොමසාරිස්වරයකු පත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යාන්ත්‍රණ පිහිටුවීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව

මානව හිමිකම් පිළිබඳ විශ්වීය ප්‍රකාශනය මගින් වෙනස්කොට නොසැලකීමේ මූලධර්මය තහවුරු කරනු ලබන හෙයින් සහ සියලුම මිනිස් ප්‍රජාව නිදහස් සහ සමාන අභිමානයකින් සහ අයිතිවාසිකම් සහිතව උපත ලබන බවට සහ ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ විශේෂත්වයන් ඇතුළුව, භේදයකින් තොරව සියලු අයිතිවාසිකම් සහ නන් වැදෑරුම් නිදහස සඳහා හිමිකම් කියන බවට ප්‍රකාශ කරනු ලබන හෙයින් ද:

කාන්තා අභිවෘද්ධිය උදෙසා නීතිය, අනුනීතිකරණය හෝ විධායක ක්‍රියා මගින් සම්පාදනය කරනු ලබන විශේෂ විධිවිධාන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිළිගනු ලබන හෙයින් ද:

ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව පිහිටුවීම කාන්තාවන් සවිබල ගැන්වීම තහවුරු කිරීම සඳහා ඵලදායී යාන්ත්‍රණයක් ලෙස කටයුතු කරනු ලබන හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පනතේ අරමුණු

2. මේ පනතේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යාන්ත්‍රණ හඳුන්වා දීම මගින් කාන්තාවන්ගේ අභිවෘද්ධිය සහ සවිබල ගැන්වීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) කාන්තාවන්ට එරෙහි සියළුම ආකාරයේ වෙනස්කොට සැලකීම තුරන් කිරීම පිළිබඳ සම්මුතිය ප්‍රකාරව කාන්තාවන්ට අදාළව ශ්‍රී ලංකා රජය විසින් භාර ගනු ලැබ ඇති බැඳීම් බලාත්මක කිරීම සඳහා යාන්ත්‍රණ හඳුන්වාදීම;

(ඇ) කාලීන මැදිහත්වීම් තුළින් සියලු අංශයන්හි සහ සියලු මට්ටම්වල කාන්තාවන්ගේ අභිවෘද්ධිය සහ සවිබල ගැන්වීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ කාන්තාවන් සවිබල ගැන්වීම සහතික කිරීම සහ පහසුකම් සැලසීමට අවශ්‍ය මූලික ව්‍යුහයක් ක්‍රමාණුකූලව සකස් කිරීම;

(ඈ) ස්ත්‍රී පුරුෂභාවය සහ ලිංගික දිශානතිය මත පදනම්ව සිදුවන සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම්වලින් කාන්තාවන් ආරක්ෂා කිරීම;

(ඉ) කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැලකීම්, කොන් කිරීම, ලිංගික හිංසනය සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා පියවර ගැනීම සහ ඊට අදාළ ක්‍රියා හෝ නොකර හැරීම් සම්බන්ධයෙන් නඩු පැවරීම සහ දඬුවම් කිරීම සඳහා වූ ක්‍රමවේද ශක්තිමත් කිරීම;

(ඊ) කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැලකීම් වළක්වා ගැනීමට සහ කාන්තාවන් සවිබල ගැන්වීම ප්‍රමුඛ කාරණයක් වශයෙන් සලකා නීති ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ සිදු කිරීම;

(උ) කාන්තාවන්ට යුක්තිය සහ සමානාත්මතාවය තහවුරු කිරීම සහ ඒ සම්බන්ධයෙන් වන අවබෝධය වර්ධනය කිරීම ද යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට සම්බන්ධ යාන්ත්‍රණයේ සියලු අවස්ථාවන්හි දී සහ තීන්දු ගැනීමේ ව්‍යුහයන් තුළ සහ රජයේ සියලු තරාතිරමකම තනතුරුවල කාන්තා සම නියෝජනය හැකි පමණ තහවුරු කිරීම සඳහා පියවර ගැනීම;

(ඈ) ආබාධ සහිත කාන්තාවන්ට විශේෂ සැලකිල්ලක් දක්වමින් කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය සවිබල ගැන්වීම තහවුරු කිරීම;

(එ) කාන්තාවන් සවිබල ගැන්වීමේ සියලු පැතිකඩවලට සම්බන්ධ පොදු අධ්‍යාපන වැඩසටහන් මෙහෙයවීම; සහ

(ඒ) සමාන වටිනාකමකින් යුත් රැකියා සඳහා ස්ත්‍රීන් හා පුරුෂයන් අතර සමාන වේතනයක් ලබාදීම තහවුරු කිරීම සඳහා නීති හා ක්‍රියාමාර්ග සංශෝධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සුරක්ෂිත කිරීම

**3.** (1) සෑම කාන්තාවක් ම කාන්තා අයිතිවාසිකම් සඳහා හිමිකම් ලැබිය යුතු අතර, කිසිදු කාන්තාවක් එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

I වන කොටස

**කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව පිහිටුවීම**

කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව පිහිටුවීම

**4.** (1) (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද, එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ සංයුතිය

**5.** (1) ජනාධිපතිවරයා විසින් (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව අවම වශයෙන් කාන්තා සාමාජිකයින් පස් දෙනකුගෙන් යුතු සාමාජිකයන් හත්දෙනකු කොමිෂන් සභාවට පත් කරනු ලැබිය යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින් -

(අ) කොමිෂන් සභාවට සාමාජිකයන් පස් දෙනකු පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන්; සහ

(ආ) කොමිෂන් සභාවට සාමාජිකයන් දෙදෙනකු පත් කිරීම සඳහා කථානායකවරයා විසින් පත්කරන ලද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදයෙන්,

නිර්දේශ ලබාගත යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාව සහ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගත

යුතු අතර නීතිය හෝ ව්‍යවස්ථාකරණය, වෘත්තීය සමිති, කළමනාකරණය සහ පරිපාලනය, ආර්ථික සංවර්ධනය, සෞඛ්‍යය, අධ්‍යාපනය, කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ දැනුම, පළපුරුද්ද සහ විශිෂ්ටත්වය සහිත හෝ කාන්තාවන්ගේ රැකියා අවස්ථා ඉහළ නැංවීමට කැප වූ තැනැත්තන් අතරින් එකී නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින්, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට හෝ කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් ඇති වූ දිනයේ සිට මාසයක කාලයක් ඇතුළත (2) වන උපවගන්තිය යටතේ වන නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය.

(5) අවම වශයෙන් සභාපතිවරයා ඇතුළු සාමාජිකයන් තිදෙනකු පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**6.** කොමිෂන් සභාව විසින්, මේ පනතේ අරමුණු සාක්ෂාත් කිරීමේ කාර්ය සඳහා පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සිදු කළ යුතු ය:-

(අ) කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීම පිළිබඳ පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම සහ II වන කොටසේ විධිවිධාන ප්‍රකාරව පැමිණිලි භාර ගැනීම;

(ආ) යම් අධිකරණයක් ඉදිරියේ පැවැත්වෙන, කාන්තාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකට අදාළ යම් නඩු කටයුතුවල දී එකී අධිකරණයේ අවසරය සහිතව ඊට මැදිහත් වීම;

(ඇ) මේ පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව කාන්තා අභිවෘද්ධිය සහ සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම;

(ඈ) (මෙහි මින්මතු "මූලික ව්‍යුහය" යනුවෙන් සඳහන් කරනු ලබන) කාන්තාවන් සවිබල ගැන්වීම සහතික කිරීම සහ පහසුකම් සැලසීම සඳහා කාන්තා අභිවෘද්ධිය සහ සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව මූලික ව්‍යුහයක් ක්‍රමානුකූලව සකස් කිරීම;෴

(ඉ) කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකට අදාළව මහජන විමර්ශන පැවැත්වීම;

(ඊ) කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමකට හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකට අදාළව නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක් විසින් සිය මෙහෙයවීමෙන් නඩු පැවරීම;

(උ) උපරිමාධිකරණයක් විසින් හෝ වෙනත් යම් අධිකරණයක් විසින් සඳහන් කරනු ලැබ ඇති කාන්තා අයිතිවාසිකම්වලට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් එකී අධිකරණය විසින් විධානය කරනු ලැබිය හැකි යම් පියවර ගැනීම;

(ඌ) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ කොමිෂන් සභාව වෙත පවරනු ලැබ ඇති යම් කර්තව්‍යයක් ඉටු කිරීමේ කාර්යය සඳහා යම් තැනැත්තකුගෙන් යම් තොරතුරු හෝ වාර්තා ඉල්ලා සිටීම හෝ කැඳවීම;

(එ) කාන්තා අයිතිවාසිකම්වලට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සමඟ අනුකූලවීම තහවුරු කිරීමට සහ කාන්තා අයිතිවාසිකම් සඳහා වන පිළිගැනීම වර්ධනය කිරීම සහ කාන්තා අයිතිවාසිකම් නිරීක්ෂණය කිරීමේ අදහසින් පැමිණිලි පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සහ විමර්ශන සිදුකිරීම;

(ඒ) පොදු ප්‍රතිපත්තීන් සහ භාවිතයන් පෝෂණය කිරීමේ අරමුණින් සහ කොමිෂන් සභාව විසින් පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී අවශ්‍ය සහාය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රාජ්‍ය ආයතනවල මණ්ඩල සමඟ අන්තර් ක්‍රියාකාරීත්වය සහ සම්බන්ධීකරණය ඇති කිරීම;

(ඔ) කොමිෂන් සභාවේ ප්‍රාදේශීය සහ පළාත් කාර්යාල විවෘත කිරීම;

(ඕ) මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ වෙනත් ආකාරයකින් නිශ්චල හෝ චංචල යම් දේපළක් අත්කර ගැනීම, ලබා ගැනීම සහ දැරීම සහ එකී නිශ්චල හෝ චංචල දේපළ විකිණීම, උකස් කිරීම, බද්දට දීම, ප්‍රදානය කිරීම, පැවරීම, රික්තවරණය කිරීම, හිමිකර දීම, හුවමාරු කිරීම හෝ බැහැර කිරීම;

(ක) කාන්තා අයිතිවාසිකම් සහ කාන්තා අයිතිවාසිකම්වලට අදාළ ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා ලද සම්මතයන් පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම සඳහා වැඩසටහන් මෙහෙයවීම සහ තොරතුරු ව්‍යාප්ත කිරීම;

(ග) පැමිණිල්ලක් ලැබීම මත හෝ සිය මෙහෙයවීමෙන් ම, මෙහි මින්මතු සලස්වා ඇති විධිවිධානවලට අනුකූලව වෙනස්කොට සැලකිල්ලට බඳුන් වී ඇති යම් කාන්තාවක් සමථකරණය වෙත යොමු කිරීම;

(ඞ) රජය සහ අමාත්‍යවරයා වෙත -

(i) කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මතයන් සහ ප්‍රමිතීන් සමඟ දේශීය නීතීන් සහ ප්‍රතිපත්තීන් සහ පරිපාලන භාවිතයන් අනුකූල වන බවට සහතික කිරීම සඳහා ගනු ලැබිය යුතු පියවර; සහ

(ii) කාන්තා අයිතිවාසිකම්වලට ගරු කිරීම, ඒවා ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ සපුරාලීම සඳහා ව්‍යවස්ථාදායකය සහ පරිපාලන විධාන සහ අවශ්‍ය කාර්ය පටිපාටි පිළිබඳ නියම කරනු ලැබිය යුතු නියෝග සකස් කිරීම,

සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඡ) වෙනස් කොට සැලකීමට සහ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ කාන්තාවන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනයන් අතර සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් නීති ප්‍රතිපත්ති සහ භාවිතයන් ඇගයීම සහ අදාළ ආයතනයන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ට) මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් හඳුනාගනු ලැබූ විවිධ කාණ්ඩවලට සහ තරාතිරම්වලට අයත් කාන්තාවන් සඳහා සමානාත්මතාවය සහ ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගැනීම;

(ඩ) පුද්ගලික තැනැත්තන් සහ වෙනත් රාජ්‍ය නොවන ආයතන විසින් ප්‍රතිපත්තීන් සහ භාවිතයන් කාන්තා අයිතිවාසිකම්වලට අදාළ වන තාක් ඒ ප්‍රතිපත්තීන් සහ භාවිතයන් වෙත ඇති බැඳීසිටීම අධීක්ෂණය කිරීම සහ ඇගයීම;

(ණ) කාන්තා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම වැඩිදියුණු කිරීමේ සහ කාන්තා අයිතිවාසිකම්වලට අදාළ කරුණු සම්බන්ධයෙන් දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීමේ සහ අධ්‍යාපනය ලබා දීමේ පර්යේෂණ සිදු කිරීම;

(ත) දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, කොමිෂන් සභාව විසින්, සියලුම විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු ය;

(ද) අගතියට පත් තැනැත්තකු විසින්, මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙහි ලා සාධාරණ ලෙස වැය කර තිබිය හැකි වියදම් පියවීමට ප්‍රමාණවත් ලෙස සැලකිය හැකි යම් මුදල් ප්‍රමාණයක් එහි පරම අභිමතය පරිදි, එම තැනැත්තා වෙත ප්‍රදානය කිරීම;

(න) මේ පනත යටතේ රීති සාදනු ලැබිය යුතු යයි නියමිත කරුණු සම්බන්ධයෙන් රීති සෑදීම; සහ

(ප) මේ පනතේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවස්ථාවෝචිත විය හැකි වෙනත් සියලුම ක්‍රියා සිදු කිරීම.

කාන්තා අභිවෘද්ධිය සහ සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම

**7.** (1) මේ පනතේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වන කාර්ය පටිපාටි සහ යාන්ත්‍රණ ඇතුළත් විය යුතු ( මෙහි මින්මතු "ජාතික ප්‍රතිපත්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) කාන්තා අභිවෘද්ධිය සහ සවිබල ගැන්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තියේ කෙටුම්පතක් කොමිෂන් සභාව විසින් සකස් කරනු ලැබිය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ කෙටුම්පත් කරන ලද ජාතික ප්‍රතිපත්තිය අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කොට ඒ පිළිබඳව සෑහීමට පත්වීමෙන් පසුව අනුමතය සඳහා එම

ජාතික ප්‍රතිපත්තියේ කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ ජාතික ප්‍රතිපත්තියේ කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබිය හැකි අතර, ඊට අනුමතය ලබාදීමට පෙරාතුව ඒ සඳහා සංශෝධන යෝජනා කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසුව අමාත්‍යවරයා විසින් එම ජාතික ප්‍රතිපත්තිය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය. එසේ පළ කරන ලද දිනයේ දී හෝ එහි නිශ්චිතව සඳහන් වෙනත් දිනයක දී අදාල ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.

(4) ජාතික ප්‍රතිපත්තියට අමාත්‍ය මණ්ඩල අනුමතය ලැබී මාසයක කාලයක් ඇතුළත අමාත්‍යවරයා විසින් එම ජාතික ප්‍රතිපත්තිය අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(5) එසේ අනුමත කරන ලද ජාතික ප්‍රතිපත්තියට සෑම අදාළ අධිකාරියක් විසින්ම අනුගත වන බවට තහවුරු කරගැනීම කොමිෂන් සභාවේ කාර්යය විය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව පාර්ලිමේන්තුව සෑහීමට පත් නොවන අවස්ථාවක දී, පාර්ලිමේන්තුව විසින් ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම කළ යුතු ය.

(7) ජාතික ප්‍රතිපත්තියට එකී සංශෝධන ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම අමාත්‍යවරයාගේ වගකීම විය යුතු අතර, සංශෝධිත ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලබාගැනීමෙන් පසුව පාර්ලිමේන්තුව වෙත නැවත ඉදිරිපත් කළ යුතු ය.

(8) ජාතික ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුව විසින් අනුමත නොකරන ලද්දේ නම් එකී අනනුමතය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

8. කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, මියයාමෙන්, නීතිය ක්‍රියාත්මකවීමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ධුරය කලින් හිස් කළහොත් මිස, වසර හතරක කාලසීමාවක් සඳහා ධුරය දරනු ලැබිය යුතු අතර, අනුගාමී හෝ අන්‍යාකාරයකින් වන යම් ධුර කාල දෙකක උපරිම කාල සීමාවකට යටත් ව නැවත පත් කිරීමකට සුදුස්සකු විය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය

9. (1) ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත කොමිෂන් සභාවේ කාන්තා සාමාජිකයන්ගෙන් එක් අයකු සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සභාපතිවරයා

(2) සභාපතිවරයා විසින්, ජනාධිපතිවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එකී ඉල්ලා අස්වීම, ජනාධිපතිවරයා විසින් භාරගත් දිනයේ සිට බලපැවැත්විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින්, 10 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, හේතු දක්වා සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව, සභාපතිවරයාගේ ධුරකාලය ඇයගේ කොමිෂන් සභාවේ සාමාජිකත්ව කාලසීමාව විය යුතු ය.

(5) අසනීප වීම, වෙනත් අශක්නුතාවක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් කරුණක් හේතුවෙන් සභාපතිවරයාට ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින්, සාමාජිකයකු වශයෙන් ඇයගේ සාමාන්‍ය කාර්යවලට අමතරව, සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම සඳහා වෙනත් යම් කාන්තා සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

10. යම් තැනැත්තකු -

කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට නුසුදුසුකම්

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු, පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වුවහොත්;

(ඈ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වස්තු භංගත්වයට පත්වූවකු බවට විනිශ්චය කරනු ලැබ ඇත්නම් හෝ විනිශ්චය කළහොත්;

(ඇ) මනසේ හෝ ශරීරයේ අසනීපයක් හෝ වෙනත් අශක්නුතාවක් හේතුවෙන් ධුරය දිගටම කරගෙන යාමට යෝග්‍ය නොවුවහොත් හෝ යෝග්‍ය නොවන තත්ත්වයකට පත් වුවහොත්;

(ඉ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින්, සිහිවිකල් වූ තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ ඇති හෝ ප්‍රකාශ කරනු ලැබුවහොත්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ සිර දඬුවමක් විඳ ඇත්නම් හෝ විඳිමින් සිටී නම්; හෝ

(උ) කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත්කරන ලද කලින් ධූර කාලය තුළ ධුරයෙන් ඉවත් කර ඇත්නම්,

ඒ තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

සාමාජිකයන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම

11. (1) සාමාජිකයකුගේ ධුරය පහත දැක්වෙන යම් හේතුවක් මත හිස්විය යුතු ය:-

(අ) එකී සාමාජිකයා මියයාම මත;

(ආ) එකී සාමාජිකයා ජනාධිපතිවරයා අමතා යවන ලද ලිපියක් මගින් ඉල්ලා අස්වීම මත ; හෝ

(ඇ) එකී සාමාජිකයා, 9 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් හේතුවක් මත ධුරයෙන් ඉවත් කිරීම මත.

(2) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරු සංඛ්‍යාවෙන් (නොපැමිණි මන්ත්‍රීවරු ද ඇතුළුව) බහුතර ඡන්දයෙන් සම්මත කරන ලද යෝජනාවක් මගින් සභාය පළ කරන ලද පාර්ලිමේන්තුව ඇමතීමකින් පසු ජනාධිපතිවරයා විසින් සිදු කරන ලද නියමයක් මගින්, (1) වන

උපවගන්තිය යටතේ ඔප්පු කරන ලද විෂමාචාරයක් හෝ අකාර්යක්ෂමතාවයක් යන හේතුව මත කොමිෂන් සභාවේ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එම යෝජනා සම්මතයේ නිවේදනය, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් එකකට අඩු නොවන සංඛ්‍යාවක් විසින් අත්සන් කර ඇත්නම් සහ එකී උද්දේශිත විෂමාචාරය හෝ අකාර්යක්ෂමතාවයේ සම්පූර්ණ කරුණු නිශ්චිතව දක්වා ඇති නම් මිස, එකී කිසිදු යෝජනා සම්මතයක් කථානායකවරයා විසින් භාර ගැනීම හෝ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සිදු නොකළ යුතු ය.

(3) ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුව ඇමතීමක් මගින් යෝජනාවක් ඉදිරිපත් කිරීම සහ එම යෝජනාව සම්මත කරගැනීම සඳහා වන කාර්ය පටිපාටිය, කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කිරීම සහ සම්මත කරගැනීම සඳහා සෑම ආකාරයෙන්ම අදාළ කරගත යුතු ය.

කොමිෂන් සභාවේ රැස්වීම්

**12.** (1) කොමිෂන් සභාවේ සභාපතිවරයා පැමිණ සිටී නම්, ඇය විසින් කොමිෂන් සභාවේ සියලුම රැස්වීම්වල මූලාසනය දරනු ලැබිය යුතු ය. එකී යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, පැමිණි සිටින සාමාජිකයන් විසින්, ඔවුන් අතරින් එක් අයකු එකී රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරාගනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් හතර දෙනෙකු විය යුතු ය.

(3) කොමිෂන් සභාවේ රැස්වීමක් -

(අ) රැස්වීම සඳහා නියම කරන ලද ස්ථානයේ, දිනයේ සහ වේලාවේ රැස්ව සිටින ගණපූරණය සංයුක්ත කරනු ලබන සාමාජික සංඛ්‍යාවක් මගින්; හෝ

(ආ) සහභාගී වන සහ ගණපූරණය සම්පූර්ණ කරනු ලබන සාමාජිකයන්ට, රැස්වීම පැවැත්වෙන කාලය අතරතුර සහභාගී වන සෑම සාමාජිකයකු ම, එකවරම දැකිය හැකි සහ ඇසිය හැකි ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදන මාධ්‍ය මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාව විසින්, රැස්වීම් සම්බන්ධ කාර්ය පටිපාටිය සහ එකී රැස්වීම්වල ගනුදෙනු කටයුතු විධිමත් කරනු ලැබිය හැකි ය.

(5) යම් රැස්වීමක තීරණ ගැනීම සඳහා වන සියලු ම ප්‍රශ්න, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක දී, මුලසුන දරන සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**13.** කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකයන් විසින් යම් සම්බන්ධතාවක් හෙළිදරව් කළ යුතු බව

**14.** කොමිෂන් සභාව විසින් ගත යුතු යම් තීරණයකට හෝ කරුණකට ඍජුවම හෝ වක්‍රාකාරයෙන් සම්බන්ධ යම් සාමාජිකයකු විසින්, එකී තීරණය ගනු ලබන කොමිෂන් සභාවේ රැස්වීමේ දී එකී සම්බන්ධතාවයේ ස්වභාවය හෙළිදරව් කළ යුතු අතර, එකී හෙළිදරව් කිරීම කොමිෂන් සභාවේ රැස්වීම් වාර්තාවල වාර්තා කළ යුතු ය. එකී සාමාජිකයා විසින්, ඒ කරුණට සම්බන්ධ යම් සාකච්ඡාවන්ට හෝ තීරණයකට සහභාගී නොවිය යුතු අතර, එකී සාකච්ඡා පැවැත්වෙන අතරතුර හෝ එකී තීරණය සකසන අතරතුර, එකී රැස්වීමෙන් ඉවත් විය යුතු ය.

යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව මත නීති කෘත්‍යයක්, ක්‍රියාවක් හෝ තීරණයක් අවලංගු නොවිය යුතු බව

**15.** කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයකුගේ පත්කිරීමේ දෝෂයක් පැවතීමේ හේතුව මත ම පමණක්, එහි කිසිදු නීති කෘත්‍යයක්, ක්‍රියාවක් හෝ තීරණයක් අවලංගු නොවිය යුතු ය.

කොමිෂන් සභාවේ මුද්‍රාව

**16.** කොමිෂන් සභාවේ මුද්‍රාව-

(අ) කොමිෂන් සභාව භාරයේ තිබිය යුතු ය;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ඇ) ස්වකීය පැමිණීමේ සලකුණක් වශයෙන් සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් තැබිය යුතු, කොමිෂන් සභාවේ එක් සාමාජිකයකු සහ කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයා ඉදිරිපිට හෝ කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයා නොපැමිණි අවස්ථාවක දී, කොමිෂන් සභාවේ යම් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය.

## II වන කොටස

### කොමිෂන් සභාවේ පරීක්ෂණ සහ විමර්ශන බලතල

126 වන ව්‍යවස්ථාව ප්‍රකාරව යොමු කිරීම මත කාර්ය පටිපාටිය

17. (1) ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක නඩු විභාගය අතරතුර උද්ගත වන, කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමකට හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකට අදාළ යම් කරුණක් පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සිදු කළ හැකි ය.

(2) කොමිෂන් සභාව විසින්, එකී යොමු කිරීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් ඇත්නම්, ඒ කාලසීමාව තුළ (1) වන උපවගන්තිය යටතේ සඳහන් කරන ලද යම් කරුණක් පරීක්ෂා කර ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් පවත්වනු ලබන අවස්ථාවක දී, මේ පනත මගින් සුරක්ෂිත කරනු ලැබ ඇති පරිදි කාන්තා අයිතිවාසිකම්හි විෂය පථය හෝ විෂය සීමාව පිළිබඳ ප්‍රශ්නයක් පැන නැගුනහොත්, කොමිෂන් සභාව විසින් එකී ප්‍රශ්නය නිශ්චය කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කරනු ලැබිය හැකි ය.

කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමක් විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවට ඇති බලය

18. (1) 17 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන කාරණාවලට අමතරව, කොමිෂන් සභාව විසින්, සිය මෙහෙයවීමෙන් ම හෝ 19 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත යම් තැනැත්තකු විසින් සිදුව ඇතැයි කියනු ලබන කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමක් පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම, සිදුකරනු ලැබිය හැකි ය:ඍ

එසේ වුව ද, කොමිෂන් සභාව විසින්, කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීම හෝ අත්‍යාසන්නව උල්ලංඝනය වීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් හෝ තත්කාලයේ බලපවත්නා වෙනත් කවර වූ හෝ නීතියක් විසින් නිර්මාණය කරන ලද හෝ පිහිටුවන ලද අධිකරණයක දී, විනිශ්චයාධිකාරයක දී, හෝ වෙනත් ආයතනයක දී සහනයක් ලැබ ඇත්නම්, එකී උල්ලංඝනය වීම සම්බන්ධයෙන් වන යම් ඉල්ලීමක් භාර නොගත යුතු ය:

එසේ වුව ද, තවදුරටත්, කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීම සම්බන්ධයෙන් 31 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තු කොමසාරිස් විසින් දැනටමත් පරීක්ෂණයක් පවත්වා ඇත්තම් එකී උල්ලංඝනය වීම සම්බන්ධයෙන් වන ඉල්ලීමක් කොමිෂන් සභාව විසින් පරීක්ෂා කිරීම නොකළ යුතු අතර, කොමිෂන් සභාව විසින් එම වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන පරීක්ෂණය හා විමර්ශනය, කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමක් මත වූ ඉල්ලුම් පත්‍රය හෝ තොරතුර ලැබුණු දිනයේ සිට එක් මාසයක කාලයක් ඇතුළත කොමිෂන් සභාව විසින් පත්කරන කමිටුවක් මගින් සිදු කරනු ලැබිය යුතු අතර, කමිටුව විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, පරීක්ෂණය සහ විමර්ශනය පවත්වනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කමිටුවක් විසින්, එහි විමර්ශනය අවසානයේ, එහි වාර්තාවක් කොමිෂන් සභාව වෙත යවනු ලැබිය යුතු ය. කොමිෂන් සභාව විසින් එකී වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව, කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමක් සිදු වී තිබේ ද යන්න පිළිබඳ අවසන් තීරණයකට එළඹිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ කමිටුවක සාමාජිකයන්ට, මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇති ව කොමිෂන් සභාව විසින් නිශ්චය කරන ලැබිය හැකි ආකාරයට දීමනාවක් ගෙවනු ලැබිය හැකි අතර, එම දීමනාව කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීම විමර්ශනය කිරීමට ඉල්ලීම් කිරීම

**19.** (1) අගතියට පත් යම් පාර්ශ්වයක් විසින් හෝ අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටින වෙනත් යම් තැනැත්තකු විසින් කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමක් සම්බන්ධයෙන්, පරීක්ෂා කර, විමර්ශනය කරන මෙන් කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කරමින්, 18 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබ ඇති පරිදි කොමිෂන් සභාව වෙත ඉල්ලීම් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලුම්පත්‍රය අදාළ අයිතිවාසිකම් උල්ලංඝනය වීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීම සිදු වූ දිනයේ සිට හෝ ඒ පිළිබඳව දැනුවත් වූ දිනයේ සිට මාසයක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය ප්‍රකාරව යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාව වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාව ඉදිරියේ එකී පැමිණිල්ල පරීක්ෂා කරනු ලබන කාල සීමාව, එකී තැනැත්තා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කිරීමේ දී හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක්, තැනැත්තෙක්, අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් වෙත සහනයක් ලබාගැනීම සඳහා වන ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි මාසයක කාලසීමාව සම්පූර්ණ කිරීමේ දී සලකා බලනු නොලැබිය යුතු ය.

පරීක්ෂණයක දී හෝ විමර්ශනයක දී පාර්ශ්ව දෙකටම කරුණු කියා සිටීමේ අවස්ථාවක් ලබා දිය යුතු බව

**20.** මේ පනතේ විධිවිධාන යටතේ පවත්වනු ලබන සෑම පරීක්ෂණයක දී සහ විමර්ශනයක දී ම, අගතියට පත් තැනැත්තාට මෙන් ම, අගතියට පත් තැනැත්තාගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලැබ ඇති බවට චෝදිත පාර්ශවයට ද කරුණු කියා සිටීමට අවස්ථාවක් ලබා දිය යුතු ය.

විමර්ශනය අවසන් වීමෙන් පසු ගනු ලැබිය යුතු පියවර

**21.** (1) 18 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබූ විමර්ශනයක් මගින් අගතියට පත් තැනැත්තකුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමක් අනාවරණය නොවන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් එම කරුණු වාර්තා කරනු ලැබිය යුතු අතර, තත්කාර්ය සඳහා කරන ලද ඉල්ලීමක් මත විමර්ශනය ආරම්භ වී ඇත්නම්, ඉල්ලුම්කරුට එම කරුණ පිළිබඳව දින දාහතරක් ඇතුළත දැනුම් දිය යුතු ය.

(2) 18 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විමර්ශනයක් මගින් අගතියට පත් තැනැත්තකුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමක් අනාවරණය වන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන පරිදි කටයුතු කළ හැකි ය :-

(අ) පැමිණිලි කරන ලද දුක්ගැනවිල්ල සාර්ථක ලෙස සමථකරණය මගින් විසඳිය හැකි බවට කොමිෂන් සභාවේ මතය වන අවස්ථාවක දී, 22 වන වගන්තිය ප්‍රකාරව සමථ මණ්ඩලයක් වෙත එම කාරණය යොමු කරනු ලැබිය හැකි අතර පාර්ශ්වයන්ට 24 වන වගන්තිය යටතේ පත් කරන ලද සමථ මුල මණ්ඩලය ඉදිරියේ පෙනී සිටින ලෙස විධාන කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) එම අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමක් සඳහා ප්‍රතිකර්ම යෙදිය හැකි හෝ වැළැක්විය හැකි ආකාරය පිළිබඳව කොමිෂන් සභාවේ මතය අනුව නිර්දේශයක් එම අදාළ තැනැත්තා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය ප්‍රකාර කොමිෂන් සභාව විසින් ගන්නා ලද පියවර පිළිබඳව එම තීරණයේ දින සිට දින දාහතරක් ඇතුළත අගතියට පත් තැනැත්තා වෙත කොමිෂන් සභාව විසින් දැනුම් දිය යුතු ය.

සමථකරණය

**22.** (1) 21 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ හෝ 38 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ සමථකරණයක් සඳහා කොමිෂන් සභාව විසින් ආරාවුලක් යොමු කරනු ලබන අවස්ථාවක දී, 24 වන වගන්තිය යටතේ පත් කරන ලද සමථ මුල මණ්ඩලය විසින් පහත සඳහන් දෑ කරනු ලැබිය යුතු ය:-

(අ) ආරාවුල සාමදානව විසඳීම සඳහා පාර්ශ්වයන්ට සහායදීමේ අදහස ඇතිව පාර්ශවයන් අතර සමථ කිරීම;

(ආ) සමථකරණ නීතිඥත්‍ය පැවැත්වීම සඳහා අදාළ වන පටිපාටික රීති වලට අනුකූලව සමථකරණ ක්‍රියාවලිය පැවැත්වීම;

(ඇ) සමථ මුල මණ්ඩලය වෙත ආරවුල යොමු කරනු ලැබූ දිනයේ සිට දින හැටක කාලසීමාවක් ඇතුළත සමථකරණ ක්‍රියාවලිය අවසන් කිරීම; සහ

(ඈ) සමථකරණ ක්‍රියාවලිය අතරතුර, සමථකරුවන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ දක්වා ඇති සම්මතයන්ට අනුකූල වීම.

**23.** (1) 21 වන, 22 වන සහ 38 වන වගන්තිවල කාර්ය සඳහා නීතිය, පරිපාලනය,අධ්‍යාපනය හෝ කාන්තාවන් සවිබල ගැන්වීම යන විෂයය ක්ෂේත්‍රවල ප්‍රගුණ කරන ලද දැනුම,පළපුරුද්ද සහ විශිෂ්ටත්වය සහිත තැනැත්තන් අතරින් පස් දෙනෙකුගෙන් සමන්විත, සමථ මූල මණ්ඩලයක් කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය.

සමථ මූල මණ්ඩල පත් කිරීම

(2) සමථ මූල මණ්ඩලය සඳහා වන චර්යා ධර්ම පද්ධතිය, ධුර කාලය සහ සමථ මූල මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් සමථකරණ නීති කෘත්‍ය පැවැත්වීමට අදාළ වන පටිපාටින් දක්වමින් රීති සාදනු ලැබිය හැකි ය.

**24.** (1) අගතියට පත් පාර්ශවකරුවන් අතර සමථකරණය මගින් විසඳුමකට පැමිණි අවස්ථාවක දී, පාර්ශවකරුවන් විසින් එකඟවන ලද බේරුම් කිරීමේ කොන්දේසි සමථ මූල මණ්ඩලය විසින්, ගිවිසුමක ආකාරයට ලිඛිත කළ යුතු අතර එකී බැඳීම්වලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු පාර්ශ්වකරුවන් විසින් එය අත්සන් කරනු ලැබිය යුතු ය. සමථ මූල මණ්ඩලය විසින් ගිවිසුමේ පිටපතක් කොමිෂන් සභාව වෙත යැවිය යුතු ය.

සමථකරණය අවසන් කිරීමෙන් පසු කාර්ය පටිපාටිය

(2) මේ වගන්තිය යටතේ සමථකරණය සඳහා කාරණයක් යොමු කර නිරාකරණයට පත් වූ අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, ඒ පිළිබඳව දින දහහතරක් ඇතුළත ඉල්ලුම්කරුව දැනුවත් කරනු ලැබිය යුතු අතර, ඉන් අනතුරුව එකී නිරාකරණය කිරීමේ කොන්දේසි ක්‍රියාත්මක කරනු ලැබීම සඳහා අවශ්‍ය විය හැකි වන්දි මුදල් ගෙවීම සඳහා වන විධාන ඇතුලු විධාන සිදු කළ යුතු ය.

(3) සමථකරණ ක්‍රියාවලිය සාර්ථක නොවන හෝ සමථකරණ ක්‍රියාවලියට එක් පාර්ශවයක් විසින් විරෝධය පාන අවස්ථාවක දී, සමථ මූල මණ්ඩලය විසින් තත්ත්වය කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතු ය.

(4) සමථකරණ ප්‍රයත්නය සාර්ථක නොවූ අවස්ථාවක දී, (3) වන උපවගන්තිය යටතේ වාර්තාව ලැබීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් -

(අ) එකී උල්ලංඝනය කිරීමේ හෝ උල්ලංඝනය වීම දිගටම සිදුවීම වැළැක්වීමේ හෝ ඊට පිළියම් යෙදීමේ අදහස ඇති ව, සුදුසු යැයි හැඟෙන නිර්දේශ නිසි අධිකාරිය වෙත හෝ අදාළ තැනැත්තා හෝ තැනැත්තන් වෙත සිදුකිරීම;

(ආ) එකී උල්ලංඝනය වීම සඳහා වගකිව යුතු තැනැත්තාට එරෙහිව අපරාධ නඩු හෝ වෙනත් නඩු කටයුතු පවරන ලෙස සුදුසු අධිකාරිය වෙත නිර්දේශ කිරීම; සහ

(ඇ) අවස්ථානුගත කරුණු අනුව සාධාරණ සහ යුක්තිසහගත යැයි සලකනු ලැබිය හැකි සහන ලබාදීම හෝ විධාන සිදු කිරීම,

සිදු කළ හැකි ය.

පාර්ශ්වකරුවන් ආදීන් විසින් ගිවිසුමේ නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු බවට කොමිෂන් සභාව විසින් නියම කිරීම

**25.** (1) කොමිෂන් සභාව විසින්, ඒ වෙත ගිවිසුම ලැබීමෙන් අනතුරුව එකී තීරණ හෝ නිර්දේශ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලුම පියවර ගනු ලබන ලෙසට ආරාවුලේ පාර්ශ්වකරුවන් සහ ගිවිසුමේ අන්තර්ගත කරනු ලැබ ඇති බේරුම් කිරීමේ නිර්දේශවල සඳහන් කරන ලද වෙනත් යම් අදාළ තැනැත්තකු හෝ රජයේ දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් වෙත, දැනුවත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති ගිවිසුමේ අන්තර්ගත තීරණය හෝ නිර්දේශය බලාත්මක කිරීමට විධාන ලැබ ඇති, එකී තීරණය හෝ නිර්දේශය බලාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නොහැකි වූ යම් අදාළ තැනැත්තකු, හෝ රජයේ දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් විසින් වහාම එහි නොහැකියාව, ඒ සඳහා වන හේතු දක්වමින් කොමිෂන් සභාව වෙත, දැනුවත් කළ යුතු ය.

කොමිෂන් සභාවේ තීරණයට එරෙහිව අභියාචනා කිරීම

**26.** (1) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණයකින් අතෘප්තියට පත්වන යම් තැනැත්තකු විසින් එකී තැනැත්තා වෙත එම තීරණය සන්නිවේදනය කරනු ලැබූ දිනයේ සිට මාසයක කාලයක් ඇතුළත එකී තීරණයට එරෙහිව අභියාචනා කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ අභියාචනවලට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තෙක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සිදුකරනු ලබන සෑම අභියාචනයක් සම්බන්ධයෙන් ම අභියාචනාධිකරණයේ ප්‍රතිශෝධනයක් ආකාරයෙන් සිදුකරනු ලබන ඉල්ලීමකට අදාළව එම ව්‍යවස්ථාව යටතේ සාදනු ලබන රීති අදාළ විය යුතු ය.

මේ පනත යටතේ පරීක්ෂණ හෝ විමර්ශන කිරීමේ බලතල

**27.** (1) කොමිෂන් සභාවට, මේ පනත යටතේ පරීක්ෂණ හෝ විමර්ශන සිදු කිරීමේ කාර්ය සඳහා පහත සඳහන් බලතල ඇත්තේ ය:-

(අ) ලිඛිත හෝ වාචික සියලු ම සාක්ෂි ප්‍රසම්පාදනය සහ එක්රැස් කිරීම සහ කොමිෂන් සභාව විසින් ප්‍රසම්පාදනය කිරීමට හෝ පරීක්ෂා කිරීමට අවශ්‍ය හෝ යෝග්‍ය යැයි

සලකනු ලැබිය හැකි පරිදි වූ, සාක්ෂි වශයෙන් වන සියලු ම තැනැත්තන් පරීක්ෂා කිරීම;

(ආ) දිවුරුම පිට හෝ ප්‍රතිඥාව පිට යම් සාක්ෂිකරුවකුට ලිඛිත හෝ වාචික සාක්ෂි ලබාදෙන ලෙස නියම කිරීම, එම දිවුරුම හෝ ප්‍රතිඥාව ඒ සාක්ෂිකරු අධිකරණයක සාක්ෂි දෙන්නේ නම් ඔහු විසින් දිය යුතු බවට නියම කරනු ලැබිය හැකි දිවුරුම හෝ ප්‍රතිඥාව විය යුතු අතර එකී දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම කොමිෂන් සභාව විසින් තත්කාර්ය සඳහා බලය දෙන ලද යම් බලධරයකු විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය;

(ඇ) යම් තැනැත්තකු, සාක්ෂි දීම සඳහා හෝ එකී තැනැත්තා සතුව ඇති ලේඛනයක් හෝ වෙනත් යමක් ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාවේ යම් නීති කෘත්‍යවලට පැමිණෙන ලෙස හෝ සහභාගී වන ලෙසට කැඳවීමට සහ සාක්ෂිකරුවකු වශයෙන් එකී තැනැත්තා පරීක්ෂා කිරීමට හෝ යම් ලේඛනයක් හෝ වෙනත් යමක් ඉදිරිපත් කරන ලෙස එකී තැනැත්තට නියම කිරීම;

(ඈ) සාක්ෂි ආඥාපනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් සාක්ෂියක් ප්‍රශ්නගත ආරාවුල සඳහා වැදගත් වන්නේ නම්, සිවිල් හෝ අපරාධ නඩුවල පිළිගැනීමට නොහැකි විය හැකි එකී සාක්ෂිය ලිඛිතව හෝ වාචිකව, පිළිගැනීම; සහ

(ඉ) එකී පරීක්ෂණය හෝ විමර්ශනය හෝ එහි යම් කොටසක් සඳහා මහජනයාගේ පැමිණීම පිළිගැනීම හෝ බැහැර කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කැඳවන ලද සෑම තැනැත්තකු විසින් ම, එකී තැනැත්තා 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ප්‍රකාරව තොරතුරු හෙළිදරව් කිරීමට තහනම් වන්නේ නම් මිස, එකී කැඳවීමට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙනු ලබන තැනැත්තකුගේ වරප්‍රසාද

28. (1) කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙනු ලබන යම් තැනැත්තකුට, එම සාක්ෂි සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ සාක්ෂි දෙන යම් සාක්ෂිකරුවකු ඒ අධිකරණය ඉදිරියේ දෙන සාක්ෂි සම්බන්ධයෙන් ඔහු නීතියෙහි ලා හිමිකම ලබන සියලු වරප්‍රසාදවලට හිමිකම් ලබන්නේ ය.

(2) යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාව වෙත හෝ කොමිෂන් සභාව ඉදිරියේ දෙන ලද ලිඛිත හෝ වාචික සාක්ෂි සම්බන්ධයෙන් යම් අධිකරණයක, යම් සිවිල් හෝ අපරාධ නඩු පැවරීමක් හෝ වෙනත් නීති කෘත්‍යක් සඳහා පිළිතුරු දීමට බැඳී නොසිටිය යුතු ය.

(3) මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති ආකාරයට යටත්ව, කොමිෂන් සභාව වෙත හෝ කොමිෂන් සභාව ඉදිරියේ යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශයක් හෝ දෙන ලද යම් සාක්ෂියක් යම් අධිකරණයක දී එම තැනැත්තාට එරෙහිව යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, නඩු විභාගයක දී හෝ වෙනත් නීති කෘත්‍යයක දී ආවේශ්‍ය කර නොගත යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ කිසිදු විධිවිධානයක්, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදය යටතේ යම් වරදක් සඳහා නඩු පැවරීමක් හෝ දණ්ඩනයක් සඳහා බලපාන ලෙස හෝ බලපාන ලෙස සලකනු ලැබීමක් ලෙස හෝ බලපාන ලෙස අර්ථ ගැන්වීම නොකළ යුතු ය:

එසේම තවදුරටත්, මේ උපවගන්තියේ සඳහන් කිසිම විධිවිධානයක් මගින්, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන යම් සාක්ෂිකරුවකුට නඩු පැවරීමේ කාර්ය සඳහා එම සාක්ෂිකරුවකුගේ නම, එම සාක්ෂිකරුගේ සාක්ෂිය හෝ සාක්ෂිවලින් යම් කොටසක් ප්‍රසිද්ධ කිරීම හෝ හෙළිදරව් කිරීම තහනම් කරනු නොලැබිය යුතු ය. නැතහොත් තහනම් කරන ලද ලෙස සලකනු නොලැබිය යුතු ය හෝ තහනම් කරන ලද ලෙස අර්ථ ගැන්වීම නොකළ යුතු ය.

සිතාසි සභාපතිවරයාගේ අත්සන යටතේ විය යුතු බව

**29.** (1) කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන සෑම සිතාසියක් ම කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අත්සන යටතේ විය යුතු ය.

(2) යම් සිතාසියක් එහි නම් කර ඇති තැනැත්තා වෙත ගෙන ගොස් භාර දීමෙන් හෝ, එම තැනැත්තාගේ අවසාන වරට දැන සිටි පදිංචි ස්ථානයක එම සිතාසිය තැබීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් එම තැනැත්තා පදිංචි ස්ථානය වෙත යැවීම මගින් භාර දෙනු ලැබිය හැකි ය.

(3) සිතාසියක් භාර දෙනු ලැබූ සෑම තැනැත්තකු ම එහි නිශ්චිතව දක්වා ඇති වේලාවේ දී හා ස්ථානයක දී කොමිෂන් සභාව ඉදිරියේ

පෙනී සිටිය යුතු අතර කොමිෂන් සභාව විසින් ඔහුගෙන් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දීම හෝ කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඔහුගේ සන්තකයේ හෝ බලයේ පවතින ලේඛන හෝ වෙනත් දේ ඉදිරිපත් කිරීම කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව අපහාසයට ලක් කිරීම

**30.** (1) කොමිෂන් සභාව ඉදිරියේ හෝ වෙනත් ආකාරයකින් කොමිෂන් සභාව සම්බන්ධයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක්, ඒ කරන ලද හෝ නොකර හරින ලද ක්‍රියාව ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් කරන ලද නම්, හෝ නොකර හරින ලද නම් ඉන් ඒ අධිකරණයේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස වරදක් සංයුක්ත වන්නේ යම් සේද එපරදිම එම කරන ලද හෝ නොකර හරින ලද ක්‍රියාවෙන්, කොමිෂන් සභාවේ අධිකාරයට හෝ ඊට අගෞරව වන පරිදි යම් අපහාස වරදක් සංයුක්ත වන්නේ ය.

(2) කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ කොමිෂන් සභාවට අගෞරව වන පරිදි සිදුකරනු ලබන සෑම අපහාස වරදක් සම්බන්ධයෙන් එය ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි කරන ලද අපහාස වරදක් ලෙස සලකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, එවැනි සෑම වරදක් ම විභාග කිරීමේ අධිකරණ බලය මෙයින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැවරෙන්නේ ය.

(3) යම් තැනැත්තකු -

(අ) මේ පනත යටතේ භාර දෙන ලද සිතාසියක සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමට කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ හේතුවක් නොමැතිව අපොහොසත් වේ නම්;

(ආ) දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ යථා පරිදි දිවුරුම් හෝ ප්‍රතිඥා දෙනු ලැබ කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන හෝ විමර්ශනය කරනු ලබන කරුණු සම්බන්ධයෙන් ඔහුට යොමු කරන ලද යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ හේතුවක් නොමැතිව, ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ පිළිතුරු දීමට අපොහොසත් වන්නේ නම්;

(ඈ) කොමිෂන් සභාව විසින් තමා වෙත නිකුත් කරන ලද දැන්වීමක හෝ ලිඛිත ආඥාවක හෝ විධානයක නියමයන්ට අනුව ක්‍රියා කිරීම, කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ අපොහොසත් වන්නේ නම්;

(ඇ) කොමිෂන් සභාව විසින් පරීක්ෂා කරනු ලබන හෝ විමර්ශනය කරනු ලබන යම් කරුණුවල සත්‍යතාව කරා ළඟාවීම සඳහා අවශ්‍ය වන බවට කොමිෂන් සභාවේ මතය වන යම් තැනැත්තකුගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක්, කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ හේතුවක් නොමැතිව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සහ පෙන්වීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ ඊට අපොහොසත් වන්නේ නම්; හෝ

(ඉ) කොමිෂන් සභාවේ යම් නිර්දේශයක් හෝ තීරණයක් සමඟ අනුකූල වීමට අසමත් වන්නේ නම්,

ඒ තැනැත්තා කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස කිරීමේ වරදට වරදකරු වන්නේ ය.

(4) යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ අගෞරව වන පරිදි (3) වන උපවගන්තියේ (ආ) හෝ (ඇ) ඡේද යටතේ යම් වරදක් සිදු කර ඇති බවට නිශ්චය කරනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් එම නිශ්චය කිරීම් දැක්වෙන සහතිකයක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කරනු ලැබිය හැකි ය. එවැනි සෑම සහතිකයක් ම කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(5) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සංජානනය කළ යුතු බවට සුදුසු යයි සලකනු ලබන, මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට යම් අපහාස වරදක් සම්බන්ධයෙන් දණ්ඩන ලබාදීම සඳහා වූ යම් නීති කෘත්‍යයක දී, (4) වන උපවගන්තිය යටතේ අත්සන් කර අධිකරණය වෙත යොමු කරන ලද සහතිකයක් බවට සලකනු ලබන යම් ලේඛනයක් -

(අ) සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර, පටහැනිව යමක් ඔප්පු කරනු ලැබුවහොත් මිස, වැඩිදුර ඔප්පු කිරීමක් නොමැතිව එවැනි සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) සහතිකයේ දක්වා ඇති නිශ්චය කිරීම කොමිෂන් සභාව විසින් සිදු කරන ලද බවට සහ එම නිශ්චය කිරීමේ සඳහන් කාරණා පිළිබඳ සාක්ෂියක් විය යුතු ය.

(6) කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි කරනු ලබන යම් උද්දේශික අපහාස වරදක් සඳහා දණ්ඩන ලබාදීම සඳහා මෙම වගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට සිදුකළ යම් නීති කෘත්‍යයක දී, මෙම පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාවේ කිසිම සාමාජිකයකු ඔහුගේ කැමැත්ත ඇතිව මිස, සාක්ෂිකරුවකු ලෙස කැඳවීම හෝ පරීක්ෂා කිරීම නොකළ යුතු ය.

III වන කොටස

## කාන්තා අයිතිවාසිකම් සඳහා වන පාර්ලිමේන්තු කොමසාරිස් සහ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

31. (1) (මෙහි මින්මතු "පාර්ලිමේන්තු කොමසාරිස්" යනුවෙන් සඳහන් කරනු ලබන) ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ යම් පැමිණිල්ලක් හෝ කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමකට හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකට සම්බන්ධ අගතියට පත් පාර්ශවයක් විසින් ඔහු වෙත යොමු කරනු ලබන පැමිණිල්ලක් භාර ගැනීමේ වගකීම දරනු ලැබිය යුතු කාන්තා අයිතිවාසිකම් සඳහා වන පාර්ලිමේන්තු කොමසාරිස් යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන තැනැත්තකු පත්කරනු ලැබිය යුතු ය. කාන්තා අයිතිවාසිකම් සඳහා පාර්ලිමේන්තු කොමසාරිස් වරයකු පත් කිරීම

(2) (1) වන උපවගන්තිය ප්‍රකාර පාර්ලිමේන්තු කොමසාරිස් ධුරය දැරීම සඳහා පත් කරනු ලබන තැනැත්තා නීතිය, මානව අයිතිවාසිකම්, සමථකරණය සහ ආරවුල් විසඳීම යන ක්ෂේත්‍රවල ඔප්පු කරන ලද හැකියාවන් සහිත යහපත් හා කීර්තිනාමයකින් යුත් තැනැත්තකු විය යුතු ය.

(3) ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හෝ කාන්තා අයිතිවාසිකම් උල්ලංඝණය වීමකට හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකට ලක් වූ හෝ ඒ පිළිබඳ දැනුවත් යම් තැනැත්තකු විසින් පාර්ලිමේන්තු කොමසාරිස් වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) පාර්ලිමේන්තු කොමසාරිස් විසින් ලද සියලු පැමිණිලි වාර්තාවක් පවත්වාගෙන යා යුතු අතර, එම පැමිණිලි ලැබුණු අනුපිළිවෙලට එක් එක් පැමිණිල්ලේ කරුණු විමර්ශනය කරනු ලැබිය යුතු ය.

(5) යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීමක නිගමනය මත, පාර්ලිමේන්තු කොමසාරිස් විසින් මේ පනතේ විධිවිධාන ප්‍රකාර නිර්දේශ සහ පැමිණිලිකරුට සහන ලබාගත හැකි මාර්ග ඇතුළත් වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. කොමිෂන් සභාව විසින් මේ පනතේ II වන කොටස ප්‍රකාර ගත යුතු ක්‍රියාමාර්ගය නිර්දේශ කිරීමේ දී පාර්ලිමේන්තු කටයුතු කොමසාරිස් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සැලකිල්ලට ගත යුතු ය.

(6) පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට අදාළ විෂයය ක්ෂේත්‍ර, ගෙවිය යුතු පාරිශ්‍රමික, ධුරයෙන් ඉවත් කිරීමේ ආකාරය, ඇතුළු ධුර කාලය සහ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා විසින් පිළිපැදිය යුතු චර්යා ධර්ම සංග්‍රහය නියමිත පරිදි විය යුතු ය.

විධායක අධ්‍යක්ෂවරයා

**32.** (1) කොමිෂන් සභාවේ උපදෙස් මත ක්‍රියා කළ යුතු, කොමිෂන් සභාවේ පොදු විධානවලට සහ පාලනයට යටත් විය යුතු සහ කොමිෂන් සභාව වෙත වගකිව යුතු විධායක අධ්‍යක්ෂවරයා වීම සඳහා නියමිත සුදුසුකම් සහිත තැනැත්තකු අමාත්‍යවරයාගේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(2) යම් ලිඛිත නීතියකට හෝ රජය විසින් කලින් කලට නිකුත් කරනු ලබන යම් මාර්ගෝපදේශයන්ට යටත් ව, විධායක අධ්‍යක්ෂවරයාගේ පාරිශ්‍රමික, සහ බඳවා ගැනීමේ පටිපාටිය ඇතුළුව සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(3) විධායක අධ්‍යක්ෂවරයාට කොමිෂන් සභාවේ රැස්වම්වලට සහභාගීවීමට සහ එම රැස්වීම්වල කතා කිරීමට හැකි වුව ද, එවැනි යම් රැස්වීමක ඡන්දය ලබාදීමට හිමිකම් නොතිබිය යුතු ය.

(4) ජනාධිපතිවරයා විසින්, (1) උපවගන්තිය යටතේ පත්කරන ලද විධායක අධ්‍යක්ෂවරයා හේතු දක්වා එම ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

**33.** (1) කොමිෂන් සභාවේ කර්තව්‍ය යථා පරිදි සහ කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි බවට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් යම් නිලධරයන් සහ සේවා නියුක්තිකයන් යම් සංඛ්‍යාවක් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින් -

(අ) කොමිෂන් සභාවේ යම් නිලධරයකු හෝ සේවා නියුක්තිකයකුගේ විනය පාලනය ක්‍රියාත්මක කිරීම හෝ ධූරයෙන් ඉවත් කිරීම;

(ආ) යම් ලිඛිත නීතියකට සහ රජය විසින් කලින් කලට නිකුත් කරනු ලබන යම් මාර්ගෝපදේශයන්ට යටත්ව නිලධරයන්ගේ සහ සේවා නියුක්තිකයන්ගේ පාරිශ්‍රමික සහ බඳවා ගැනීමේ පටිපාටි ඇතුළුව සේවා කොන්දේසි නියම කිරීම; හෝ

(ඇ) කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයන්ගේ සුභසාධනය උදෙසා අර්ථසාධක අරමුදලක් සහ වෙනත් යම් සුභසාධක සහ ආරක්ෂක ක්‍රම ඇති කිරීම සහ නියාමනය කිරීම මෙන්ම එවැනි අරමුදලක් හෝ යෝජනා ක්‍රම සඳහා දායක මුදල් ලබා දීම,

සිදු කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ ඉල්ලීම පිට, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු එම නිලධරයාගේ එකඟත්වය ඇතිව සහ එම නිලධරයා සේවය කරන අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ රාජ්‍ය පරිපාලන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, කොමිෂන් සභාව නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය: නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(4) (අ) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(ආ) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(ඇ) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා රජයට සේවය කිරීමට එකඟ වෙමින් රජය සමඟ යම් ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු කොමිෂන් සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තා කොමිෂන් සභාව වෙත සේවය කරන ලද කාලය, එම ගිවිසුම යටතේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා රජයට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### කාන්තාවන් සඳහා වූ ජාතික අරමුදල

කාන්තාවන් සඳහා වූ ජාතික අරමුදල පිහිටුවීම

**34.** (1) මේ පනතේ කාර්ය සඳහා (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "කාන්තාවන් සඳහා වූ ජාතික අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අරමුදල පරිපාලනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ බලය කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය යුතු ය.

(3) පහත දැක්වෙන මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය:-

(අ) කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමතය ඇතිව ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින් ආධාර, ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග හෝ රික්තවරණ වශයෙන් කොමිෂන් සභාවට ලැබෙන සියලු ආකාර මුදල්; හෝ

(ඇ) කොමිෂන් සභාවේ නිශ්චල හෝ චංචල දේපළ විකිණීමෙන් කොමිෂන් සභාවට ලැබෙන සියලු මුදල්.

(4) පහත දැක්වෙන මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය: -

(අ) මේ පනත යටතේ එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීමේ දී, කොමිෂන් සභාව විසින් දරන ලද වියදම් පියවා ගැනීම සඳහා අවශ්‍ය කරන සියලු මුදල්;

(ආ) කාන්තාවන්ගේ අයිතිවාසිකම් උදෙසා යම් විශේෂිත හෝ ඉටුකළ යුතු දායකත්ව හඳුනා ගැනීමේ දී යම් පුද්ගලයකුට හෝ සංවිධානයකට යම් පාරිතෝෂිත ගෙවීමක් සිදු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් බලය දෙන ලද සියලු මුදල්; හෝ

(ඇ) මේ පනත මගින් හෝ ඒ යටතේ අරමුදලින් ගෙවනු ලැබීමට නියම කරනු ලබන සියලු මුදල්.

කොමිෂන් සභාව විසින් මුදල් ආයෝජනය කළ හැකි බව

**35.** කොමිෂන් සභාව විසින් අරමුදලේ පවත්නා ඊට වහාම අවශ්‍ය නොවන මුදල් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි මුදල් අමාත්‍යවරයා විමසා කාන්තාවන් සවිබල ගැන්වීමට සහාය වන්නාවූ වැඩසටහන්වල ආයෝජනය කරනු ලැබිය හැකි ය.

ගිණුම් සහ විගණනය

**36.** (1) කොමිෂන් සභාව විසින්, එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ වගකීම් සහ කොමිෂන් සභාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි පරිදි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන කොමිෂන් සභාවේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

## V කොටස

### සාමාන්‍ය විධිවිධාන

නියෝග

**37.** (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව විමසා, මේ පනත මගින් නියම කළ යුතු කරුණු සම්බන්ධයෙන් හෝ නියෝග සාදනු ලැබීම සඳහා බලය දෙනු ලැබ ඇති කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් කිහිපයක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) කොමිෂන් සභාව විසින් 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් කර ඇති කමිටුව පත් කළ යුතු ආකාරය නියම කරමින්;

(ආ) 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් කර ඇති කමිටුවට පත් කරනු ලබන තැනැත්තන්ට අවශ්‍ය සුදුසුකම් නියම කරමින්;

(ඇ) 18 වන වගන්තිය ප්‍රකාර පවත්වනු ලබන පරීක්ෂණයක් හෝ විමර්ශනයක් සම්බන්ධයෙන් කමිටුව විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කරමින්;

(ඈ) මේ පනතේ විධිවිධාන ප්‍රකාර, කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි හා දුක්ගැනවිලි සම්බන්ධයෙන් යොදා ගත යුතු යාන්ත්‍රණ හෝ ක්‍රියාවලීන් හඳුනා ගනිමින්;

(ඉ) විවිධ කාණ්ඩ සහ තත්ත්වයන්හි කාන්තාවන් හඳුනා ගනිමින් අදාළ කාණ්ඩ හෝ තත්ත්වයන්හි සමානතාව සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා යොදා ගත යුතු ක්‍රියාමාර්ග නියම කිරීම;

(ඊ) මූලික ව්‍යුහයට අනුකූල වන ආකාරය නිශ්චිතව දක්වමින් අදාළ බලධරයන් වෙත මාර්ගෝපදේශ නිකුත් කිරීම;

(උ) කාන්තාවන්ගේ ආර්ථික සවිබල ගැන්වීම අවශ්‍ය වන ප්‍රදේශ සහ මූලික ව්‍යුහය යටතේ සපුරාලිය යුතු ඉලක්ක නියම කිරීම සහ ජාතික ආර්ථිකයට කාන්තාවන්ගේ දායකත්වය සියයට පනහකට නොඅඩු වන බවට වගබලා ගැනීම;

(ඌ) සවිබල ගැන්වීමේ මූලික පියවරක් ප්‍රවර්ධනය කිරීම සඳහා යාන්ත්‍රණ පිහිටුවීමක-

(i) ආබාධ සහිත කාන්තාවන්ට විශේෂ සැලකිල්ලක් දක්වමින් කාන්තාවන්ගේ සමාජ ආර්ථික තත්ත්වය සවිබල ගැන්වීම සඳහා;

(ii) සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්ව ක්‍රියා බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීම, හොර ජාවාරම් සහ සූරාකෑම්වලින් ගැහැණු දරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා;

(iii) ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ වෙනස් කොට සැලකීම සඳහා සහන ලබාගැනීම සඳහා අධිකරණ ක්‍රියාවලිය වෙත ප්‍රවේශවීමට කාන්තාවන්ට සහාය වීමේ ආධාරක පද්ධතියක් සඳහා;

(ළු) කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා පුද්ගලික තැනැත්තන් සහ වෙනත් රාජ්‍ය නොවන ආයතන විසින් යොදාගනු ලැබිය යුතු ප්‍රතිපත්ති සහ පරිචයන් නියම කරමින්; සහ

(ළූ) මේ පනතේ මූලධර්ම සහ විධිවිධාන ඉටු කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම පළකිරීමේ දින හෝ එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් පසු දිනයක සිට බලාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරනු ලබන සෑම නියෝගයක් ම, ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

38. (1) ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය රජයේ දෙපාර්තමේන්තුවක් බවට උසස් කිරීම සඳහා අවශ්‍ය පියවර අමාත්‍යවරයා විසින් ගනු ලැබිය යුතු ය. මේ පනත යටතේ අමාත්‍යවරයා සතු විශේෂ බලතල

(2) 37 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයකට අනුකූල වීමට අසමත් වන යම් තැනැත්තකු විසින් එම අනුකූල නොවීම සඳහා හේතු අමාත්‍යවරයා වෙත ලිඛිතව දැනුම් දීමට වගබලා ගත යුතු ය. ඉදිරිපත් කරන ලද හේතු පිළිබඳ අමාත්‍යවරයා සෑහීමට පත්වුවහොත්, අමාත්‍යවරයා විසින් අනුකූලවීමේ කාලසීමාව දීර්ඝ කිරීමක් සිදු කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් දීර්ඝ කරන ලද කාලසීමාව තුළ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගයකට අනුකූලවීමට යම් තැනැත්තකු අපොහොසත් වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් අදාළ කාරණය සමථකරණ ක්‍රියාවලිය මගින් විසඳීම සඳහා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ සමථකරණය වෙත යොමු කරන ලද කරුණක් සඳහා, 22 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ),(ආ),(ඇ) සහ (ඈ) ඡේදවල විධිවිධාන අදාළ විය යුතු ය.

වාර්ෂික වාර්තාව

**39.** කොමිෂන් සභාව වෙත යොමු කරන ලද සියලු කරුණුවල ලැයිස්තුවක් සහ ඒ පිළිබඳව ගන්නා ලද පියවර එම එක් එක් කරුණ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිර්දේශ ද සහිතව වාර්තාවක් කොමිෂන් සභාව විසින් සෑම එක් එක් මුදල් වර්ෂයක් අවසානයේ දී ම, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව විසින් තම බලතල, කාර්ය හෝ කර්තව්‍ය පවරා දෙනු ලැබිය හැකි බව

**40.** කොමිෂන් සභාවේ කටයුතු කාර්යක්ෂමව කරගෙන යාමට අවශ්‍ය වන තාක් දුරට මේ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කොමිෂන් සභාවට සහාය වීම සඳහා පත්කරනු ලැබ ඇති යම් නිලධරයකුට, හෝ නිලධරයන්ට පවරනු ලැබිය හැකි අතර, එම නිලධරයා හෝ නිලධරයන් විසින් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විශේෂ හෝ සාමාන්‍ය විධානවලට යටත්ව එකී බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ සිදු කරන ලද එවැනි බලතල පැවරීමක් කොමිෂන් සභාව විසින් ඉවත් කරගනු ලැබිය හැකි ය.

දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා කොමිෂන් සභාවේ සියලුම සාමාජිකයන් රජයේ සේවකයන් වශයෙන් සැලකිය යුතු බව

**41.** කොමිෂන් සභාවේ සාමාජිකයන්, කොමිෂන් සභාවට සහාය වීමට පත්කරන ලද නිලධරයන් සහ සේවා නියුක්තිකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයින් ලෙස සලකනු ලැබිය යුතු අතර මේ පනත යටතේ පවත්වනු ලබන සෑම පරීක්ෂණයක්ම හෝ විමර්ශනයක්ම එම සංග්‍රහයේ අර්ථානුකූලව අධිකරණ කාර්ය පටිපාටියක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

**42.** 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ III වන කොටසේ I වන පරිච්ඡේදයේ "අල්ලස් හෝ දූෂණවලට අදාළ වැරදි" යන ශීර්ෂය යටතේ වන විධිවිධාන මේ පනතේ විධිවිධාන සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන බවට සලකනු ලැබිය යුතු ය.

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන අදාළ වන බව

**43.** (1) මේ පනත යටතේ කොමිෂන් සභාව මත පනවන ලද හෝ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී සද්භාවයෙන් කරන ලද කිසිවක් සඳහා යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට හෝ එවැනි සාමාජිකයකු හෝ නිලධරයකු විසින් බලය පවරන ලද යම් නිලධරයකුට සිවිල් හෝ අපරාධ වගකීමක් පවරනු නොලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ නිලධරයන් සිවිල් හෝ අපරාධ නඩු පැවරීමකින් ආරක්ෂා කිරීම

(2) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාවට එරෙහිව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී කොමිෂන් සභාව වෙත ගෙවනු ලබන හෝ කොමිෂන් සභාව විසින් අයකර ගනු ලබන යම් පිරිවැය අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ යම් උචිත සාධන පත්‍රයක් යටතේ හෝ කොමිෂන් සභාවේ විධාන මත යම් තැනැත්තකු විසින් සිදුකරන ලද හෝ සිදුකරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට දී එම තැනැත්තාට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී, එම තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, එම ක්‍රියාව එකී තැනැත්තා විසින් සද්භාවයෙන් සිදුකරනු ලැබූ බවට එම අධිකරණය විසින් තීරණය කරයි නම් සහ එම තැනැත්තා විසින් එම වියදම යම් සිවිල් හෝ අපරාධ නඩුවකින් අය කරගෙන නොමැත්තේනම් මිස, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**44.** (1) මේ පනත යටතේ රීති සෑදීමට නියමිත හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය. මේ පනත යටතේ සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ රීති

(2) කොමිෂන් සභාව විසින් සාදනු ලබන සෑම රීතියක්ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබිය යුතු අතර එසේ අනුමත කරනු ලැබූ රීති සහ අනුමත කරන ලද බවට වන නිවේදනය මාස තුනක් නොඉක්මවන සාධාරණ කාලයක් තුළ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර,එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ එහි නිශ්චිතව දක්වා ඇති වෙනත් දිනයක දී බලාත්මක විය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ යම් රීතියක් ඕනෑම අවස්ථාවක යම් ආකාරයකට සංශෝධනය කිරීම, එකතු කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපනය

**45.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන සහ 45 වන ව්‍යවස්ථා යටතේ මෙම පනතේ ක්‍රියාක්මකභාවය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"සමථකරුවන් සඳහා වන චර්යා සංග්‍රහය" යන්නෙන්, මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන සමථකරුවන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය අදහස් වේ;

"තැනැත්තා" යන්නට, යම් සංස්ථාපිත හෝ සංස්ථාපිත නොකල පුද්ගල මණ්ඩලයක්, සහ පුද්ගලික තැනැත්තෙක් ඇතුළත් වන අතර ව්‍යවස්ථාදායක හෝ අධිකරණමය ආයතන ඊට ඇතුළත් නොවේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ නියෝග මගින් නියම කරන ලද යන්න අදහස් වේ;

"පුද්ගලික තැනැත්තා" යන්නෙන්, රජය හෝ රාජ්‍ය ආයතනයක් හෝ රාජ්‍ය සේවකයෙක් නොවන යම් තැනැත්තෙක් අදහස් වන අතර ඊට රජය, ආණ්ඩුව හෝ යම් රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් එහි කොටස්වලින් හෝ අයිතියෙන් සියයට පනහකට වඩා අඩු ප්‍රමාණයක් දරනු ලබන යම් සංස්ථාපිත තැනැත්තකු ඇතුළත් වේ; සහ

"කාන්තා අයිතිවාසිකම්" යන්නෙන් අධ්‍යාපනයට සහ රැකියා අවස්ථා සඳහා පිවිසීමට කාන්තාවන්ට සමාන අවස්ථා වර්ධනය කිරීම සහ අනන්‍යතාවක් සහිතව ජීවත් වීමට අවස්ථාව සලසමින් ලිංගික හිරිහැර වලින් සහ කාන්තාවන්ට එරෙහි සෑම ආකාරයකම ප්‍රචණ්ඩත්වයෙන් තොර නිදහස තහවුරු කිරීම ඇතුළුව කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම තුරන් කිරීමේ සම්මුතියේ විස්තර කරනු ලැබ ඇති ඉලක්ක සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව මගින් දක්වා ඇති කාන්තාවන් සඳහා වූ සමානාත්මතාවයට සහ වෙනස්කොට නොසැලකීමට වන අයිතිවාසිකම් අදහස් වේ.

**46 .** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.